ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2016/03/21 |

## 2016 පෙබරවාරි මස උද්ධමනය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (2013=100) විචලනය මගින් මනිනු ලබන උද්ධමනය, ලක්ෂ්‍යාමය පදනම මත 2016 ජනවාරි මාසයේ දී වාර්තා කළ සියයට -0.7 හි සිට 2016 පෙබරවාරි මාසයේ දී සියයට 1.7 දක්වා ඉහළ ගියේය. ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි ආහාර කාණ්ඩයෙහි සමස්ත මිල පහළ යාම ඉක්මවා යමින් මධ්‍යසාර පාන වර්ග සහ දුම්කොළ; රෙදිපිළි හා පාවහන්; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු ; සෞඛ්‍ය; ප්‍රවාහන සහ විවිධ භාණ්ඩ හා සේවා යන උප කාණ්ඩයන්හි දක්නට ලැබුණු සැලකිය යුතු මිල ගණන් ඉහළ යාම් හේතුවෙන්, ආහාර නොවන කාණ්ඩය ලක්ෂ්‍යාමය උද්ධමනය ඉහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් දායක විය.

වාර්ෂික සාමාන්‍ය පදනම මත මනිනු ලබන ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි වෙනස 2016 ජනවාරි මස වාර්තා වූ සියයට 2.9 හි සිට 2016 පෙබරවාරි මස දී සියයට 2.6 දක්වා පහළ ගියේය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සැලකූ විට එම දර්ශකය 2016 ජනවාරි සිට 2016 පෙබරවාරි දක්වා සියයට 1.1 කින් පහළ ගියේය. ආහාර හා මධ්‍යසාර නොවන පාන වර්ග අයත් කාණ්ඩයේ අයිතමයන්හි මිල ගණන් පහළ යාම, දර්ශකයේ මෙම මාසික පහළ යාම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු විය. එළවළු,

සහල්, අමු මිරිස්, ලොකු ළූනු, රතු ළූනු, අර්තාපල් සහ දෙහි මිල ගණන් මෙම මාසය තුළ දී පහළ ගියේය. මධ්‍යසාර පාන හා දුම්කොළ; නිවාස, ජලය, විදුලිය, ගෑස් හා අනෙකුත් ඉන්ධන; ගෘහ භාණ්ඩ, ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු; සෞඛ්‍ය; සහ විවිධ භාණ්ඩ හා සේවා උපකාණ්ඩවල මිල ගණන් ද 2016 පෙබරවාරි මාසය තුළ දී ඉහළ ගියේය. මේ අතර, රෙදිපිළි හා පාවහන් සහ ප්‍රවාහන උපකාණ්ඩවල මිල ගණන් 2016 පෙබරවාරි මාසය තුළ දී පහළ ගියේය. සන්නිවේදන; විනෝදාත්මක හා සංස්කෘතික; අධ්‍යාපන; ආපනශාලා හා හෝටල් සහ විවිධ භාණ්ඩ හා සේවා උපකාණ්ඩවල මිල ගණන් මෙම මාසය තුළ නොවෙනස්ව පැවතිණි.



## ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි හැසිරීම

**පදනම : 2013 = 100**

| වසර | මාසය | දර්ශක අගය | මාසික % වෙනස | ලක්ෂ්‍යමය % වෙනස | වාර්ෂික සාමාන්‍ය % වෙනස |
|---|---|---|---|---|---|
| 2014 | ජනවාරි | 103.1 | | | |
| | පෙබරවාරි | 103.0 | -0.1 | | |
| | මාර්තු | 103.2 | 0.2 | | |
| | අප්‍රේල් | 104.1 | 0.9 | | |
| | මැයි | 104.9 | 0.8 | | |
| | ජූනි | 106.2 | 1.2 | | |
| | ජූලි | 107.0 | 0.8 | | |
| | අගෝස්තු | 106.4 | -0.6 | | |
| | සැප්තැම්බර් | 106.4 | 0.0 | | |
| | ඔක්තෝබර් | 106.0 | -0.4 | | |
| | නොවැම්බර් | 106.9 | 0.8 | | |
| | දෙසැම්බර් | 108.6 | 1.6 | | |
| 2015 | ජනවාරි | 112.8 | 3.9 | 9.4 | |
| | පෙබරවාරි | 108.9 | -3.5 | 5.7 | |
| | මාර්තු | 107.6 | -1.2 | 4.3 | |
| | අප්‍රේල් | 107.0 | -0.6 | 2.8 | |
| | මැයි | 108.0 | 0.9 | 3.0 | |
| | ජූනි | 109.1 | 1.0 | 2.7 | |
| | ජූලි | 108.9 | -0.2 | 1.8 | |
| | අගෝස්තු | 108.4 | -0.5 | 1.9 | |
| | සැප්තැම්බර් | 108.4 | 0.0 | 1.9 | |
| | ඔක්තෝබර් | 109.2 | 0.7 | 3.0 | |
| | නොවැම්බර් | 112.0 | 2.6 | 4.8 | |
| | දෙසැම්බර් | 113.2 | 1.1 | 4.2 | 3.8 |
| 2016 | ජනවාරි | 112.0 | -1.1 | -0.7 | 2.9 |
| | පෙබරවාරි | 110.8 | -1.1 | 1.7 | 2.6 |

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව